WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

62 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

| | | |
|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය | I, II | පැය තුනයි |
| குடியியற் கல்வி | I, II | மூன்று மணித்தியாலம் |
| Civic Education | I, II | *Three hours* |

## (62) පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** අතීතයේ දී සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කරගෙන පාලන කටයුතු සිදු කළ රාජ්‍යය වන්නේ,
(1) බ්‍රිතාන්‍යය ය. (2) ඇතැන්ස් ය. (3) ස්විට්සර්ලන්තය ය. (4) ඉන්දියාව ය.

**2.** ශ්‍රී ලංකාවේ පුරවැසියකුට ඡන්දය භාවිත කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ වයස් සීමාව වන්නේ,
(1) වයස අවුරුදු 15 සම්පූර්ණ කර තිබීම ය. (2) වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම ය.
(3) වයස අවුරුදු 21 සම්පූර්ණ කර තිබීම ය. (4) වයස අවුරුදු 24 සම්පූර්ණ කර තිබීම ය.

**3.** රාජ්‍යයක මූලික ලක්ෂණ නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය
(2) භූමිය, ආණ්ඩුව, ස්වාධිපති බලය, විරුද්ධ පක්ෂය
(3) ජනගහනය, ස්වාධිපති බලය, අධිකරණය, ආණ්ඩුව
(4) ජනගහනය, ආණ්ඩුව, ජනාධිපති, විධායක බලය

**4.** ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු විසින් සමාජය වෙත ඉටු කළ යුතු යුතුකම් වර්ග දෙක වන්නේ,
(1) සිවිල් හා දේශපාලන යුතුකම් ය. (2) සංස්කෘතික හා ආගමික යුතුකම් ය.
(3) ආර්ථික හා සමාජයීය යුතුකම් ය. (4) නීතිමය හා සදාචාරාත්මක යුතුකම් ය.

**5.** ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පාලන කටයුතු පවත්වාගෙන යාමේ ජනතාව සතු බලය හඳුන්වන්නේ,
(1) ඡන්ද බලය යනුවෙනි. (2) උත්තරීතර බලය යනුවෙනි.
(3) පරමාධිපත්‍ය බලය යනුවෙනි. (4) ව්‍යවස්ථාදායක බලය යනුවෙනි.

**6.** මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරාදීම යනු,
(1) බලය විමධ්‍යගත කිරීමයි. (2) බලය බෙදීමයි.
(3) බලය පවරා දීමයි. (4) බලය නියාමනය කිරීමයි.

**7.** සන්ධීය රාජ්‍යයක බලය බෙදාහැරීම සිදු වන්නේ,
(1) ජනාධිපති හා මධ්‍යම ආණ්ඩුව අතර ය.
(2) ජනාධිපති හා ප්‍රාන්ත ආණ්ඩු අතර ය.
(3) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩුකාරවරයා අතර ය.
(4) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර ය.

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

8. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් සභාවක මහ ඇමතිවරයා ද ඇතුළු ව අමාත්‍ය මණ්ඩලය
   (1) හතරදෙනකුගෙන් සමන්විත ය. (2) පස්දෙනකුගෙන් සමන්විත ය.
   (3) හයදෙනකුගෙන් සමන්විත ය. (4) හත්දෙනකුගෙන් සමන්විත ය.

9. ස්විට්සර්ලන්තයේ දේශපාලන ව්‍යුහය තුළ බලතල ක්‍රියාවට නැංවීමේ දී ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් එය විසඳීමේ බලය ඇත්තේ,
   (1) ජාතික සභාවට ය. (2) කැන්ටන් අධිකරණයට ය.
   (3) සන්ධීය මහා මණ්ඩලයට ය. (4) විධායක මහා සභාවට ය.

10. බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන වැදගත් ප්‍රතිඵලයකි,
   (1) එකිනෙකාට ගරු කිරීමට පුරුදු වීම.
   (2) රාජ්‍ය භාෂා කිහිපයක් භාවිත කළ හැකි වීම.
   (3) විවිධ සංස්කෘතීන් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වීම.
   (4) ජන වර්ග හා විවිධ ජන කණ්ඩායම් අතර විශ්වාසය තහවුරු වීම.

11. මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීමට යාමේ දී ගැටලු මතුවීමට ප්‍රධාන හේතුවක් වන්නේ,
   (1) අවශ්‍යතා පිරිමසා ගැනීමට අවශ්‍ය සම්පත් සීමිත වීමයි.
   (2) පුද්ගලයාගෙන් පුද්ගලයාට අවශ්‍යතා වෙනස් වීමයි.
   (3) අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය දැනුම ප්‍රමාණවත් නොවීමයි.
   (4) අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවීමයි.

12. ආර්ථික නොවන භාණ්ඩයක් හා ආර්ථික භාණ්ඩයක් පිළිවෙළින් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
   (1) ජලය හා ආහාර (2) ජලය හා වාතය
   (3) ඖෂධ හා හිරු එළිය (4) ඇඳුම් හා ආහාර

13. ආර්ථිකයක සිදුවන ක්‍රියාවලිය අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) නිෂ්පාදනය, පරිභෝජනය, බෙදාහැරීම (2) නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය
   (3) නිෂ්පාදනය, ගබඩා කිරීම, බෙදාහැරීම (4) නිෂ්පාදනය, ගබඩා කිරීම, පරිභෝජනය

14. පුද්ගලයා තුළ, පුද්ගලයන් අතර, පවුල තුළ, පවුල් අතර ඇතිවන ගැටුම් හඳුන්වන්නේ,
   (1) සාර්ව ගැටුම් ලෙස ය. (2) පවුල් ගැටුම් ලෙස ය.
   (3) සූක්ෂ්ම ගැටුම් ලෙස ය. (4) පුද්ගල ගැටුම් ලෙස ය.

15. ගැටුම් නිරාකරණය සඳහා පුරවැසියකු විසින් වර්ධනය කරගත යුතු පුද්ගල ගුණාංග ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) අන් අයට ගරු කිරීම, අන්මත ගරු කිරීම, සාධාරණත්වය
   (2) දරා ගැනීමේ ශක්තිය, පරිත්‍යාගශීලී බව, සහානුභූතිය
   (3) ඵලදායී සන්නිවේදනය, නිර්මාණාත්මක චින්තනය, සවන් දීම
   (4) ආත්මාවබෝධය, ඉවසීම, දරාගැනීමේ ශක්තිය

16. නීතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ,
   (1) ජනතාවගේ ආරක්ෂාව සහතික වන ආකාරයට පාලනය මෙහෙයවීමට මග පෙන්වීම ය.
   (2) ජනතාවගේ ජීවිත, දේපළ හා අයිතිවාසිකම් රැකෙන සේ මානව හැසිරීම් පාලනය කිරීම ය.
   (3) ජනතාව තුළ නීතිය පිළිබඳ දැනුම තහවුරු කිරීම ය.
   (4) සමාජයේ වැරදි කරන පුද්ගලයන් සියලු දෙනා අධිකරණය හමුවට පැමිණවීම ය.

17. ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළ ම අභියාචනා අධිකරණය ලෙස ක්‍රියාත්මක වන්නේ,
   (1) මහාධිකරණයයි. (2) අභියාචනාධිකරණයයි.
   (3) ශ්‍රේෂ්ඨාධිකරණයයි. (4) යුද්ධාධිකරණයයි.

18. මිනීමැරුම් හා සම්බන්ධ නඩු විභාග කිරීමේ බලය ඇති අධිකරණය වන්නේ,
   (1) අභියාචනාධිකරණයයි. (2) පළාත්බද මහාධිකරණයයි.
   (3) දිසා අධිකරණයයි. (4) මහාධිකරණයයි.

19. මරණ දඬුවම නියම වුවකුගේ එම දඬුවම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශය ජනාධිපතිවරයාට ලබාදීම සිදු කරන්නේ,
   (1) නීතිපතිතුමා විසිනි. (2) අග්‍රවිනිශ්චයකාරතුමා විසිනි.
   (3) සොලිසිටර් ජනරාල්තුමා විසිනි. (4) අධිකරණ ඇමතිතුමා විසිනි.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දේ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**20.** 1931 දී සිදු කරන ලද ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ පිහිටුවනු ලැබූ ආයතනය මින් කුමක් ද?
(1) ව්‍යවස්ථාදායක සභාව (2) රාජ්‍ය මන්ත්‍රණ සභාව
(3) ජාතික රාජ්‍ය සභාව (4) පාර්ලිමේන්තුව

**21.** 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සිදු කරන ලද ප්‍රධානතම වෙනස්කම වන්නේ,
(1) සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීමයි. (2) ජනමත විචාරණ ක්‍රමය හඳුන්වා දීමයි.
(3) විධායක ජනාධිපති ධුරය ඇති කිරීමයි. (4) පළාත් සභා ක්‍රමය හඳුන්වා දීමයි.

**22.** 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි වන්නේ,
(1) පාර්ලිමේන්තුව පත්වී අවම වශයෙන් වසරක කාලයක් අවසන් වූ පසුව ය.
(2) පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුතු යැයි අගමැතිවරයා ඉල්ලා සිටි විටක ය.
(3) ජනාධිපතිවරයාට අභිමත පරිදි ඕනෑම අවස්ථාවක දී ය.
(4) පාර්ලිමේන්තුව පත් වී අවම වශයෙන් වසර හතරහමාරක් ගත වූ පසුව ය.

**23.** ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්ය අතුරෙන් පොදු උපයෝගිතා සේවාවලට අයත් **නොවන** කාර්යයක් වන්නේ,
(1) පොදු ස්ථානවලට විදුලිය ලබා දීම ය. (2) මහජන වෙළෙඳපොළ පවත්වාගෙන යාම ය.
(3) මහජන වැසිකිළි ඉදිකිරීම හා නඩත්තු කිරීම ය. (4) පොදු කියවීම් ශාලා පවත්වාගෙන යාම ය.

**24.** මිනිසාගේ මැදිහත් වීමෙන් ගොඩනැගී ඇති ආගම්, කුල, උරුම, සිරිත් විරිත්, අයිතිවාසිකම්, යුතුකම්, නෛතික සම්ප්‍රදායන් ආදී අංශ ඇතුළත් පරිසරය හඳුන්වන්නේ පහත සඳහන් කවර නමකින් ද?
(1) සමාජ පරිසරය (2) ස්වාභාවික පරිසරය
(3) ජෛව පරිසරය (4) මානව පරිසරය

**25.**
A - පරිගණක සාක්ෂරතාව
B - මූර්ත දළ ජාතික නිෂ්පාදිතය
C - හරිත දළ දේශීය නිෂ්පාදිතය
D - ආර්ථික වර්ධන වේගය
E - භෞතික ජීවන තත්ත්ව දර්ශකය

සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන ඉහත දක්වා ඇති මිනුම් අතුරෙන් සාම්ප්‍රදායික මිනුම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A හා B (2) B හා C (3) B හා D (4) D හා E

**26.** පරිසරය සම්බන්ධ පුරවැසි වගකීමක් වන්නේ,
(1) සංවර්ධන කටයුතුවල දී පරිසර පිරිවැය තක්සේරු කිරීම ය.
(2) දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් පරිසර හිතකාමී පුරවැසියන් බිහි කිරීම ය.
(3) සැමවිට ම පරිසර හිතකාමී ජීවන ක්‍රමයක් අනුගමනය කිරීම ය.
(4) පරිසරය හා සම්බන්ධ නීති රාමුවට අනුකූල ව කටයුතු කිරීමට පුරවැසි ආකල්ප සංවර්ධනය කිරීම ය.

**27.** සංවර්ධිත රටවල ලක්ෂණ දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) නාගරික ජන සංඛ්‍යාව අඩු අතර ළදරු මරණ අනුපාතය ද අඩු ය.
(2) ආයු අපේක්ෂාව ඉහළ මට්ටමක පවතින අතර, ජන සංඛ්‍යා වර්ධන වේගය වැඩි ය.
(3) භෞතික ජීවන තත්ත්ව දර්ශකය ඉහළ වන අතර, විදේශ විනිමය ඉපැයීම අඩු ය.
(4) මානව සංවර්ධන දර්ශකය ඉහළ අගයක් ගන්නා අතර, ජන සංඛ්‍යා වර්ධන වේගය අඩු ය.

**28.** ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවන් මගින් මූලික අයිතිවාසිකම් කඩවීමක දී ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි කොට සාධාරණ විනිශ්චයක් ලබා ගැනීමට ඕනෑම පුද්ගලයකුට හැකි ය.
(2) මූලික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කර උචිත නිර්දේශ ලබාදීමේ බලය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සතු ය.
(3) ඕනෑම පුද්ගලයකුට මානව හිමිකම් කඩවීම සම්බන්ධ නඩු කටයුත්තක තීන්දුවක් පිළිබඳ සෑහීමට පත් නොවේ නම්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව වෙත පැමිණිලි කළ හැකි ය.
(4) රජයේ හෝ පළාත් පාලන ආයතන නිලධාරියකු විසින් කරන ලද මානව හිමිකම් කඩ කිරීමක් සම්බන්ධ පැමිණිලි විභාග කොට වැරදිකරුවන්ට දඬුවම් කිරීමේ බලය පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) සතු ය.

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**29.** තිරසාර සංවර්ධනය සම්බන්ධ පුරවැසි යුතුකමක් ලෙස සැලකිය හැක්කේ මින් කුමක් ද?
(1) අධි පරිභෝජනයෙන් වැළකීම
(2) පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා නිෂ්පාදකයින් දිරිගැන්වීම
(3) පරිසර ප්‍රමිතීන් හඳුන්වා දීම
(4) පාරිසරික බලපෑම් තක්සේරු කිරීම

**30.** යම් රටක විදේශීය ශුද්ධ සාධක ආදායම සැලකිල්ලට ගැනීමෙන් පසුව වර්ෂයක් තුළ නිපදවන සියලු භාණ්ඩ හා සේවාවල වටිනාකම්වල එකතුව හඳුන්වන නම කුමක් ද?
(1) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය (2) මූල්‍ය දළ ජාතික නිෂ්පාදිතය
(3) දළ ජාතික නිෂ්පාදිතය (4) හරිත දළ දේශීය නිෂ්පාදිතය

**31.** භෞතික පරිසරයට හානි සිදුවන ස්වාභාවික සංසිද්ධි දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) කාන්තාරීකරණය, ලවණීකරණය (2) සුළි කුණාටු, සුනාමි
(3) හිම දියවීම, සාගර ජල මට්ටම ඉහළ යාම (4) ගෝලීය උණුසුම් වීම, අම්ල වැසි ඇති වීම

**32.** පරිසර විනාශයට ප්‍රධාන හේතුවක් ලෙස සැලකිය හැකි කරුණ වන්නේ ජනතාවගේ,
(1) දිළිඳුකම ය. (2) අඩු අධ්‍යාපනය ය. (3) නොදැනුවත්කම ය. (4) වැරදි ආකල්ප ය.

**33.** අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනතට ඇතුළත් වන ප්‍රධාන නීතිමය ලේඛන සංඛ්‍යාව,
(1) 6 කි. (2) 5 කි. (3) 4 කි. (4) 3 කි.

**34.** යුදමය අරමුණු මත පිහිටුවා ගන්නා ලද කලාපීය සංවිධානයක් වන්නේ කුමක් ද?
(1) ආසියාන් (ASEAN) (2) නේටෝ (NATO) (3) සාර්ක් (SAARC) (4) බිම්ස්ටෙක් (BIMSTEC)

**35.** කිසියම් රටක් රාජ්‍ය උපාය සම්බන්ධතා ගොඩනගා ගැනීමේ දී බලපාන වැදගත්ම සාධකය වන්නේ එම රටෙහි,
(1) භූගෝලීය පිහිටීමයි. (2) දේශපාලන ස්ථාවරභාවයයි.
(3) විදේශ ප්‍රතිපත්තියයි. (4) ආර්ථික ප්‍රතිපත්තියයි.

**36.** ජාත්‍යන්තර සබඳතාවල වර්තමාන ස්වරූපය දෙස බලන කල දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
(1) ජාත්‍යන්තර ත්‍රස්තවාදයට අනුබල දීම ය.
(2) බහු ජාතික සමාගම් දුබල රාජ්‍යවල සම්පත් සූරාකෑම ය.
(3) ප්‍රබල රාජ්‍ය සිය බල කඳවුරු ශක්තිමත් කර ගැනීමට උත්සාහ දැරීම ය.
(4) ප්‍රබල රාජ්‍ය දුබල රාජ්‍ය වෙත විවිධාකාර බලපෑම් කරනු ලැබීම ය.

**37.** සප්තා (SAPTA) සහ සෆ්තා (SAFTA) වෙළෙඳ ගිවිසුම් ඇති කර ගන්නා ලද්දේ පහත සඳහන් කවර සංවිධානයක සාමාජික රටවල් අතර ද?
(1) ආසියාන් (2) බිම්ස්ටෙක් (3) යුරෝපා සංගමය (4) සාර්ක්

**38.** සංවර්ධිත රටවල් මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල් ද පොදුවේ මුහුණ දෙන ගැටලුවකි,
(1) අවාසිදායක වෙළෙඳ ශේෂයක් පැවතීම. (2) දේශපාලන අස්ථාවරත්වයක් තිබීම.
(3) ජාත්‍යන්තර ත්‍රස්තවාදයේ බලපෑම. (4) දේශීය සම්පත් හිමිකම විදේශිකයන් සතු වීම.

**39.** රාජ්‍ය අතර සාමකාමී සම්බන්ධතා පවත්වාගෙන යන ප්‍රධාන මාධ්‍යය වන්නේ,
(1) තානාපති සේවයයි. (2) ආරක්ෂක අමාත්‍යාංශයයි.
(3) ජනාධිපති කාර්යාලයයි. (4) විදේශ කටයුතු අමාත්‍යාංශයයි.

WWW.OLEVELAPI.COM

**40.** පහත **I තීරුවේ** එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන තුනක් හා **II තීරුවෙහි** ඒවාට අදාළ බලතල හා කාර්ය කිහිපයක් ද දක්වා ඇත.

| **I තීරුව** | **II තීරුව** |
|---|---|
| 1 - මහා මණ්ඩලය | A - එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා පාලනය කිරීම |
| 2 - ආරක්ෂක මණ්ඩලය | B - අවි පාලනය සඳහා සැලසුම් සම්පාදනය |
| 3 - ලේකම් කාර්යාලය | C - නිරායුධකරණය හා අවි සීමා කිරීමේ ප්‍රතිපත්ති විමර්ශනය කිරීම හා නිර්දේශ කිරීම |
| | D - මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කිරීම |

**I තීරුවේ** අනුපිළිවෙළට ගැළපෙන සේ **II තීරුව** සකස් කළ විට නිවැරදි පිළිතුර කුමක් ද?
(1) A, B, C (2) B, A, D (3) C, B, A (4) D, C, B

* *

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....